# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 අප්‍රේල් මස 03 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**

**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.34 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
චන්ද්‍රසෝම සරණලාල්
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමීත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
රවීන්ද්‍ර යසස් කුමානායක
රවි විජේසේකර
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සෙනල් වෙල්ගම
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අශෝක රන්වල
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
උදාර රත්නායක
එස්. කුහවර්ධන්
කාමල් කුරුප්පු
කිත්සිරි මංචනායක
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නවුසර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
ලයනල් ජයසිංහ
ලෙනාඩ් කරුණාරත්න
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සුසාර දිනාල්
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා

## 01. සභාපතිවරයාගේ නිවේදන :

*i*

*"සභා රැස්වීම් පැවැත්වෙන දිනයක් ලෙස, මින් පෙර තීරණය කර තිබූ 2018.04.17 දින සභා රැස්වීම නොපැවැත්වීමටත්, අද දින සභා රැස්වීමෙන් පසුව 2018.05.08 දින සභා රැස්වීම පැවැත්වීමටත් සුදුසු බව පසුගිය සභා කටයුතු කාරක සභාවේදී එකඟතාවයකට පැමිණි බවත්, ඒ අනුව සභාවේ රැස්වීම සම්බන්ධ යෝජනාවක් අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"පසුගිය සභා රැස්වීම් දිනවල මෙන්ම, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව, එතුමාගේ අසනීප තත්ත්වය සලකා බලා තාවකාලිකව එතුමාට පහසු ආසනයක් හා අදාළ පහසුකම් ලබා දීමට කටයුතු කර තිබෙන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*අයවැය නිල [හැන්සාඩ්] වාර්තා :*

*"2018 වර්ෂය වෙනුවෙන් පැවති අයවැය විවාදයේ 2017 දෙසැම්බර් මස 11 හා 12 යන දිනයන්හි නිල [හැන්සාඩ්] වාර්තා අද දින සභාගත කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2018.03.21 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව පිළිගන්වන ලදී.

***පූ.භා. 10.29 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 03. පළාත් සභාවේ රැස්වීම

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්] විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*ගරු සභාපතිතුමනි, "2018.03.21 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, අද දින (2018.04.03 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම පළාත් සභාව 2018.05.08 වන දින (අඟහරුවාදා දින) පෙ.ව. 9.30 ට රැස් විය යුතු අතර, 2018.04.17 දිනය (අඟහරුවාදා දිනය) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."*

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ශ්‍රී ලංකාව වසර 2500 කට එහා ගිය වැදගත් ඉතිහාසයක් ඇති රටක් ලෙස, අප විසින් උදම් අනමින් සිටිය ද, අපගේ පසු එන පරපුරට සාරගර්භව අභිමානයකින් යුතුව, වර්ණනා කළ හැකි අතීතයක් හිමි වන පරිදි, වර්තමානයේ දේශපාලන නායකයන් වන අප විසින් දියුණු රටක් නිර්මාණය කිරීමට කටයුතු කර නොතැබුවහොත්, එය අපගේ වගකීමක් පැහැර හැරියා වේ. එහෙයින් ජාතික ධනය, බලය, මෙන්ම අප සැමගේම සුරු විරුකම්, හැකියාවන් උපරිමයෙන් රටේ දියුණුව වෙනුවෙන් යොදවා, ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නගා, සැමදා ඇති වන ගංවතුර, නියඟ ආදී ස්වභාවික විපත්වලින් මෙන්ම, අනාගතයේ ඇති විය හැකි ගැටළු ද කලින්ම හඳුනාගෙන, ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ, මේ රටේ ජාතික, ආගමික, සමාජමය, බලමුළු එක්තැන් කර සංහිඳියාවකින් යුතුව, එක මගක් ගෙන, ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ද ආරක්ෂා කර ගනිමින්, සීඝ්‍ර දියුණුවක් කරා මෙම රට රැගෙන යාමට සියලුම මහජන නියෝජිතයන් පෙරමුණ ගත යුතු යැයි ද, ඒ සඳහා*

*වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයිද, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි. "*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.10 ට ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කොරළගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. කල් තැබීමේ යෝජනාව :

ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"දැන් මෙම සභාව කල් තැබිය යුතු ය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

### කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ප්‍රශ්න :

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින්, සභාව කල් තබන අවස්ථාවේදී ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

අ. 2017, 2018 වසර දෙකේදී පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කළ බඳවා ගැනීම් මොනවාද? එක් එක් තනතුරු වශයෙන් කොපමණ සංඛ්‍යාවක්ද?

ආ. ආදේශක හෝ තාවකාලික සෞඛ්‍ය කාර්ය සහායක ලෙස 2017 දී පළාතේ රෝහල්වල බඳවා ගැනීම් කොපමණ සිදු කළේද? බඳවා ගත් පදනම පැහැදිලි කරන්න.

ඇ. 2018 වර්ෂයේ පළාත් රෝහල් සේවය සඳහා තවත් සෞඛ්‍ය කාර්ය සහායකවරුන්/වරියන් බඳවා ගන්නේද? ඔවුන් කී දෙනෙක්ද? බඳවා ගන්නේ කවර පදනමකින්ද?

ඈ. තාවකාලික සේවයට පිරිසක් බඳවා ගෙන සේවයේ යොදවා සිටියදී ස්ථිර සේවය සඳහා සෞඛ්‍ය කාර්ය සහායකවරුන්/වරියන් පිරිසක් බඳවා ගන්නේද?

*එවලේ, අදාළ අමාත්‍යවරයා සභා ගර්භයේ නොසිටි බැවින්, ගාමිණී තිලකසිරි ගරු අමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයීමට සති 02 ක කාලයකට කල් ගන්නා ලදී.*

*අනතුරුව, එකී ප්‍රශ්න ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලෙස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [ලලිත් එල්ලාවල මහතා ] විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.*

***අනතුරුව, පළාත් සභාව අ.භා. 01.22 ට, 2018 මැයි මස 08 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.04.03
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.